# අනුරාධපුර නව නගර සැලසුම බිහිවීම පිළිබඳ අධ්‍යයනයක්

ජේ. පී. සී. මධුවන්ති

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. chamodi6170@gmail.com

**ප්‍රමුඛ පදඃ** අනුරාධපුර, නව නගර සැලසුම, පැරණි නගරය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජධානිය වූ අනුරාධපුරයෙහි වැදගත්කම හුදෙක් ඓතිහාසිකත්වයට පමණක් සීමා වූවක් නොවේ. මේ පෞරාණික නගරයේ දක්නට ලැබෙන ගොඩනැඟිලි ස්මාරක විශේෂයෙන් ශ්‍රී ලාංකිකයන් ගේ ද ලෝකවාසීන්ගේ ද අවධානයට ලක්වී ඇත.අදවන විට ද ඉතිරිවී ඇති ශේෂයන් ඔස්සේ මෙම නගරය මනා පැවැත්මකින් මෙන් ම සැලසුම්කරණයකින් යුක්ත වූ බව තවදුරටත් තහවුරු කරලයි. මෙම පර්යේෂණයේ දී අධ්‍යයනයට ලක්වන අනුරාධපුර නව නගර සැලසුම බිහිවීමට පදනම් වී ඇත්තේ අනුරාධපුර පැරණි නගරයයි. මෙසේ නිර්මාණය වී ඇති නව නගර සැලසුම බොහෝකලක සිට වර්තමානය තෙක් ක්‍රමානුකූල ව විකාශනය වී ඇත. අනුරාධපුර නව නගර සැලසුම අක්කර කුන්දහසක භූමියක් තුළ ක්‍රියාත්මක වේ. ස්වභාවිකව පිහිටා ඇති මල්වතු ඔය, නුවර වැව හා බුලංකුලම වැව ආදිය මෙහි ප්‍රධාන සීමාවන් ලෙස සැලකිය හැකි ය. වර්තමානය වන විටදී මෙම නගර සැලසුම නව නාගරිකරණ ලක්ෂණයන්ගෙන් යුක්ත ව වෙනස්වීම් වලට ලක්වෙමින් ක්‍රියාත්මක වේ. අක්කර තුන්දහසක භූමියක් පදනම් කරගෙන මෙම නගර සැලසුම ක්‍රියාත්මක වූ අතර මල්වතු ඔය, නුවර වැව හා බුලංකුලම වැව ආදිය මෙහි ප්‍රධාන සීමාවන් ලෙස සැලකිය හැකි වේ.

## ක්‍රමවේදය

අනුරාධපුර නව නගර සැලසුම කෙසේ බිහිවූයේ ද යන ගැටළුව මත පදනම්ව පර්යේෂණයේ තොරතුරු විමර්ශනය කරනු ලැබීය. අනුරාධපුර පැරණි නගරය පිළිබඳව බොහෝ විචාරකයන් පර්යේෂකයන් අවධානය යොමුකරමින් නගරය සම්බන්ධ කරුණු අනාවරණය කර ඇත. එහෙත් අනුරාධපුර නව නගර සැලසුම බිහිවීම පිළිබඳ පර්යේෂණය සඳහා යොමු වී ඇති අවධානය අල්පය. එ බැවින් එම අවකාශය පූර්ණය කරනු ලැබීම මෙම පර්යේෂණයේ අරමුණයි. අනුරාධපුර නව නගර සැලසුම පිළිබඳ කරුණු අධ්‍යයනයේ දී සාහිත්‍ය ලේඛන මූලාශ්‍ර මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනයන් ඔස්සේ ද කරුණු ගොනුකිරීම සිදුකරනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මූලාශ්‍ර තොරතුරු අනුව අනුරාධපුර නගරය විජයාගමනයත් සමඟ ක්‍රි:පූ 6 වන සියවසේ දී පිහිටුවා ඇති අතර අනුරාධවරුන් දෙදෙනෙකුගේ නිජභූමිය මෙන්ම අනුර නැකතින් බිහිවූ බැවින් අනුරාධපුරය වූ බව දැක්විය හැකි ය (සුමංගල හිමි, දේවරක්ෂිත. 1999. පිට 50). පසුකාලීනව රාජ්‍යත්වයට පත් වූ පණ්ඩුකාභය රජු විසින් අනුරාධපුරය තම රාජධානියක් ලෙස නිර්මාණාත්මක සැලසුමකින් යුක්තව ගොඩනැගීම තුළ සංවිධිත සැලසුම්කරණයක් මෙම නගරය

තුළ නිර්මාණය වූ බව මූලාශ්‍ර වල දැක්වේ. මහාවංශය තුළ දැක්වෙන පණ්ඩුකාභය රජුගේ විස්තරයට අනුව මෙම නගරය පාලකයාගේ වාසභවන හා පාලන මධ්‍යස්ථානයක් පමණක් නොව රටේ ජාතික සංකලපයක් බවට සකස් විය යුතු බව ආරම්භක සංකල්පය විය. ඒ අනුව ආගමික පූජස්ථාන, සුසාන භූමි, විවිධ ජනකොටස් වලට වෙන් වූ වාසස්ථාන ද ඉදිකරන්නට වීය (සුමංගල හිමි, දේවරක්ෂිත. 1999. පිට 51).

එසේ අනුරාධපුරය ශුද්ධ භූමියක් බවට පත්වූයේ, දෙවනපෑතිස් රජු සමයේ ය. ඉන් පසුව බිහි වූ පාලකයන් ද තමන්ගේ රාජ්‍ය සමය තුළ දී තවත් අංගයන් නගරයට එකතුකරමින් වඩා පහසුකම් සහිත ව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව නගරය තුළ වැව් අමුණු , විනෝදාස්වාදය සපයන ස්ථාන ජෝතිය වැනි වන උයන් ද තිසා වැව අභය වැව යන වැව් ආදියෙන් ද නගරය මැදින් ගලා ගිය කදම්බ නදියෙන් ද සමන්විත විය. පසුකාලීනව භූගත නල මාර්ග, නගර ආරක්ෂක පවුරු ආදි ඉදිකිරිම් සිදුකරීමට පසුකාලීන රජවරුද දායකත්වය සැපයීය. එහෙත් පසු කාලීනව සිදු වූ දකුණු ඉන්දීය බලපෑම් නිසා නගරයේ පරිහානිය සිදුවීම ඇරඹි අතර මුළු නගරය කැලෑවෙන් වැසී යන්නට විය.

විදේශීය ආක්‍රමණයන් වලට 16 වැනි සියවසේදී මුහුණදීමට ශ්‍රී ලාංකිකයන්ට සිදුවුව ද මේ පෘතුගීසීන් හා ලන්දේසි යන විදේශිය ජාතිකයන්ගේ යුගයේදී ලංකාවේ විවිධ ප්‍රදේශයන්ට බලපෑම් සිදු වුවද අනුරාධපුර නගරයට විශාල බලපෑමක් ඇති කිරීමක් දක්නට නොමැති අතර ඒ කාලය තුළ දී අනුරාධපුර මහත් දියුණුවට පත් ව තිබූ නගරයක් නොවන අතර ඔවුන් වැඩි අවධානයක් මේ නගරයට යොමු කර තිබුණේ ද නැත.

එහෙත් බ්‍රිතාන්‍ය සමය වන විටදී ඔවුන්ගේ බලපෑම් සහිත නගරයක් බවට මෙය පත්විය. නුවර කලාවිය ලෙස නම් වූ මේ ප්‍රදේශය 1873 දී උතුරුමැද පළාත ලෙස වෙන් කොට ගෙන පවත්වාගෙන යාම ආරම්භ කළ අතර මෙහි දී නුවරකලාවිය තමන්කඩුව යන දිස්ත්‍රික්ක දෙක එකට කර මෙහි පාලන කටයුතු ආරම්භ විය (කරුණානන්ද, 2001 . පිට 1)

බ්‍රිතාන්‍යයන් තමන්ගේ පරිපාලන කටයුතු කරගෙන යන්නට වූයේ අනුරපුර වැසියන් උතුම්කොට සලකන පූජා නගරය මධ්‍යයේ ය. අනුරාධපුර නගරයේ පූජා භූමිය තුළ බ්‍රිතාන්‍ය ඉදිකිරීම් බෙහෙවින් දක්නට ලැබුණි. එයට හේතුව වූයේ ඔවුන් අගනගරයක් ලෙස මෙම නගරය යොදා ගත්තා සේම ඔවුන් නවීන ගොඩනැගිලි වන සෞඛ්‍ය නිලධාරි නිවාසය, පරිපාලන නිලධාරින්ගේ නිවාස මෙන් ම පූජා භූමිය තුළ මස්කඩ ද ඉදිකළ අතර ඒ අවට දේවස්ථානයක් පවා ස්ථාපිත කරන්නට විය (කරුණානන්ද. 2003. පිට 92-97).

මෙම කටයුතුවලට විරුද්ධ ව බෞද්ධයන් නැගී සිටින්නට වූ අතර එහි ප්‍රධානිත්වය වලිසිංහ හරිස්චන්ද්‍ර විසින් උසුලන්නට විය. ඔවුන්ගේ උත්සාහය වූයේ, අනුරාධපුර මීට පෙර යුගයන්හි දී කොටස් දෙකකට බෙදා පැවැතියා සේ මෙම යුගයේ දී ද ශුද්ධ නගරය හා නව නගරය ලෙස වෙන් කර එම නව නගරයට මේ සියලු පරිපාලන අංගයන් රැගෙන යාමට යි. නමුත් මෙම යෝජනාවට බ්‍රිතාන්‍යයන් එකඟ නොවූයේ ඔවුනට මේ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීම හේතුවෙනි.

1913 දී වලිසිංහ හරිස්චන්ද්‍ර මියාමත් සමඟ මේ පිබිදීමේ ව්‍යාපාරය පරිහානියට ලක්විය (කරුණානන්ද. 2003. පිට 73). ඒ අනුව බෞද්ධයන්ගේ මෙම ඉල්ලීම් 1941 වන තුරුම ක්‍රියාත්මක කර ගැනීමට හැකි වූයේ නැත. එවකට එස්. ඩබ්ලිව්. ආර්. ඩී.

බණ්ඩාරනායක මහතා මේ නගරය සංරක්ෂණය කරන ලෙස රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එයට මුදල් වෙන්කර ගැනීමේ හැකියාවද ලැබිණි.

මේ ඔස්සේ අනුරාධපුර නගරය 1949 දී නගර නිර්මාණ ශිල්පී හොලිඩේ ක්ලිපර්ඩ් මහතාගේ මූලිකත්වයෙන් නගරයේ සැලසුම්කරණය බිහි වීම සිදු වීය. ඒ අනුව මෙම නගරයේ කටයුතු ආරම්භයේ දී අපේක්ෂා කළ ජනගහනයට වඩා වැඩි ජනගහනයක් පදිංචිකරලීම ද මෙහි දී සිදු වූ අතර ඔවුනට ඇවැසි සියලු පහසුකම් සැලසීමට ද මෙම නව නගරය තුළ කටයුතු සැලසිණි.

මේ නගර සැලසුම සම්බන්ධ ව අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය පිහිටවූයේ ද වූයේ මෙහි කටයුතු නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම උදෙසාය. 1979 වන විට මෙහි පාලන කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය යටතට පැවරුණු අතර නූතනය වන විට ද එය යටතේ නගරයේ කටයුතු පාලන වෙමින් පැවතීම දැකගත හැකිවේ.

මෙම පර්යේෂණයේ දී අධ්‍යනයට ලක් කරනු ලබන්නා වූ විෂය පථය තුළ දී අනුරාධපුර පැරණි නගරය විජයාගමනයෙන් ආරම්භ වන ජනාවාසකරණ වීම තුළ දි සිදුවූ ක්‍රියාදාමයන් ඔස්සේ විකාශනය වෙමින් පණ්ඩුකාභය රාජ්‍ය සමය වන විට දි ඉතා දියුණු මට්ටමේ නගරයක් ලෙස ස්ථාපිත වන අතර බ්‍රිතාන්‍ය යුගයේ දී සිදුවන විවිධ මැදිහත් වීම් නිසා එම පෞරාණික නගරයට සිදුවීය. එම හේතුවෙන් එම හානි මඟහරවාලීම සඳහා නූතන නගර සැලසුම බිහි වී ඇති අතර එය විවිධාකාර ලෙස වෙනස් වෙමින් නූතන නාගරීකරණ ලක්ෂණයන්ට අනුගතව වර්තමාන තත්ත්වය දක්වා පැමිණ තිබෙන ආකාරය දැක ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


සුමංගල හිමි, දේවරක්ෂිත බටුවන්තුඩාවේ (1996) *මහාවංසය සිංහල (ප්‍රථම භාගය).* එස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10

කරුණානන්ද, උක්කු බණ්ඩා (1991) *බ්‍රහ්මචාරි වලිසිංහ හරිශ්චන්ද්‍ර සහ අනුරාධපුර බෞද්ධ ප්‍රබෝධය 1899 - 1913*, එස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10

කරුණානන්ද, උක්කු බණ්ඩා (2001) *බ්‍රිතාන්‍ය යටතේ උතුරුමැද පළාත 1900-1931.* ගොඩගේ පොත් මැදුර. කොළඹ 10